සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2014
இரண்டாம் தவணை மதிப்பீடு - 2014
**Second Term Evaluation - 2014**

| 9 ශ්‍රේණිය<br>தரம் 9<br>Grade 9 | භූගෝල විද්‍යාව I හා II පත්‍රය<br>புவியியல் வினாத்தாள்-11<br>Geography Paper I & II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |
|---|---|---|

## I - පත්‍රය

නම/විභාග අංකය: ..............................................................................................

- **උපදෙස්**

**පළමු කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) භූගෝල විද්‍යාඥයින් සොයාගත් සාක්ෂි අනුව දනට ජීවීන් සිටින එකම ග්‍රහයා වන්නේ,
(1) සිකුරු ග්‍රහයා (2) බ්‍රහස්පති ග්‍රහයා
(3) නිල් ග්‍රාහයා (පෘථිවිය) (4) සෙනසුරු ග්‍රහයා

(02) වායු ගෝලයේ පෘථිවියට ආසන්නතම හා වැදගත් ම වායු ස්ථරය නම්,
(1) පරිවර්ති ගෝලයයි. (2) තාප ගෝලයයි.
(3) අපරිවර්ති ගෝලයයි. (4) මෙසෝන් ගෝලයයි.

(03) ගෝලීය ජලයෙන් සාගර ජලයට අයත් වන ජල ප්‍රතිශතය වන්නේ,
(1) 93% කට වැඩි ප්‍රමාණයක් (2) 95% කට වැඩි ප්‍රමාණයක්
(3) 97% කට වැඩි ප්‍රමාණයක් (4) 99% කට වැඩි ප්‍රමාණයක්

(04) නිල් ග්‍රහයගේ නිරන්තර ක්‍රියාකාරීත්වයක් ඇති ජීවය පවතින කොටස අප හඳුන්වන්නේ,
(1) වායු ගෝලය නමිනි. (2) ශිලා ගෝලය නමිනි.
(3) ජලගෝලය නමිනි. (4) ජෛව ගෝලය නමිනි

(05) ලොව භූමි ප්‍රමාණයෙන් 1/3 ක් පමණ වන ආසියාව යුරෝපයෙන් වෙන් වන්නේ,
(1) රතු මුහුදෙන් ය. (2) හිමාලයා කඳු වැටියෙනි.
(3) කැස්පියන් මුහුදෙන් ය. (4) යූරල් කඳුවැටියෙන් ය.

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

(06) ලොව ව්‍යාප්ත වී ඇති කඳුමුදුන් අතරින් ලෝකයේ උසම කඳුමුදුන ලෙස නම් දරා ඇත්තේ ..........................
..................................................

(07) චීනයේ ආඳෝනාව හෙවත් ශෝකය නමින් හැඳින්වෙන්නේ ........................................................................ ය.

(08) මැද පෙරදිග රටවල් ප්‍රබල ලෙස නියෝජනය වෙමින් තෙල් මිල පාලනය කිරීමට පිහිටුවා ගෙන තිබෙන සංවිධානය වන්නේ ........................................................ යයි.

(09) වනාන්තර බිම් ගිනි තැබීමෙන්, භූමියේ සරු බව රැක ගැනීමට වරින් වර බිම් මාරු කරමින් කරන ගොවිතැන හඳුන්වන්නේ .................................................. ගොවිතැන ලෙසයි.

(10) ආසියාවේ කොරියාව, තායිවානය, සිංගප්පූරුව වැනි රටවල් වැඩි අවධානයක් යොමු කරන්නේ .................................... කිරීමේ කර්මාන්තවලටයි.

* අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(11) දකුණු ආසියාව හා අග්නිදිග ආසියාව යා කෙරෙමින් බෙංගාල බොක්ක ආසන්නයේ පිහිටි රටවල් එකතු වී පිහිටුවා ගත් සංවිධානය හඳුන්වන්නේ බිම්ස්ටෙක් නමිනි. ( )

(12) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ලෝකඩ රිදී හා මැටිවලින් කර්මාන්ත තිබූ බවට සාධක යොමු වී ඇත. ( )

(13) කොළඹ පුරවර ප්‍රදේශයට ගම්පහ කොළඹ හා රත්නපුර දිස්ත්‍රික්ක අයත් වෙයි. ( )

(14) හෝටන් තැන්නෙන් ආරම්භ වී ත්‍රිකුණාමලය අසලින් මුහුදට එක්වන මහවැලි ගඟේ මුළු දිග කි.මී. 331 කි. ( )

(15) අතීතයේ පැවති ජල සම්පාදන ක්‍රම අතර ආඩියා ළිංවලින් ජලය ලබාගැනීමේ ක්‍රමය ලංකාවේ බහුල ලෙස යොදා ගත්තේ ඌව පළාතේ ය. ( )

* අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.

(16) යාපනය හා මහනුවර ප්‍රධාන නගර යා කරමින් ඉදි වූ මාර්ගය අප හඳුන්වන්නේ, .............................. ලෙසයි. (A3 මාර්ගය, A6 මාර්ගය, A9 මාර්ගය)

(17) දකුණු ප්‍රදේශයේ භූ විෂමතාවය අනුව වෙරළබඩ තීරයේ තැනිතලා ලක්ෂණ ක්‍රමයෙන් රට තුළට යන විට .................................. ලක්ෂණයක් බවට පත් වී ඇත. (වගුරුබිම්, මොහොරෙට්ටි, උස්බිම්)

(18) ලංකාවේ සුළු පොල් ත්‍රිකෝණය ලෙස නම් කර ඇත්තේ රන්න කණමල්විල .................................. යන ප්‍රදේශවල පොල් වගාවයි. (කංගල්ල, මීද්දෙනිය, අම්බලන්තොට)

(19) ශ්‍රී ලංකාවේ වැඩිම වී වගා බිම් ප්‍රදේශයක් ඇති කිරීමට හේතු වූ ප්‍රථම බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය වූයේ, .................................................. සංවර්ධන යෝජනා ක්‍රමයයි. (මහවැලි, ගල්ඔය, වලවේ)

(20) කුමන කුරුළු පාරාදීසය, පාසිකුඩා, කල්කුඩා, නිලාවේලි යන ස්ථාන මුල් කරගෙන ලංකාවේ දියුණු කළ හැකි කර්මාන්තය වන්නේ, .................................................. යයි. (ධීවර, කල්, සංචාරක)

(ලකුණු : 20 x 2 = 40)